# අසිරිමත් ශ්‍රී ලංකා ඡායාරූප ප්‍රදර්ශනය සහ සුහද හමුව

ඕස්ට්‍රේලියාවේදී පවත්වන ලද ලෝක කුසලාන ක්‍රිකට් තරගාවලියට සමගාමීව ඕස්ට්‍රේලියා ශ්‍රී ලංකා සංස්කෘතික සහ සුබසාධක සංගමය විසින් නසංවිධානය කරන ලද ඡායාරූප ශිල්පි සඳුන් ගමගේ ගේ අසිරිමත් ශ්‍රී ලංකා ඡායාරූප ප්‍රදර්ශනය සහ සුහද හමුව පසුගිය මැයි මස 28 වන දින කෝබර්ග් නගර ශාලාවේදී පැවැත්වුණි.

මෙහිදී ප්‍රවීණ ක්‍රිකට් ක්‍රීඩක දුලිප් ලියනගේ සමතා ක්‍රිකට් ක්ෂෙත්‍රයට කරන ලද අතිවිභාල සේවය වෙනුවෙන් ඔස්කා සංගමයේ අගැයීමට පාත්‍ර විය. සඳුන් ගමගේ මහතා ඡායාරූප ක්ෂෙත්‍රයට හා ශ්‍රී ලංකාවේ මාධ්‍ය වෙනුවෙන් ඉටු කරන ලද සේවාව උදෙසා ඔස්කා සංගමයේ සම්මානයටද පාත්‍රවිය. සම්මාන ප්‍රදානය මෙල්බන්හි කොන්සල් ජනරාල් උපුල් පුෂ්පකුමාර මහතා අතින් සිදුවිය.
















**'අසෙනිය කුසුම' නම් මේ පුංචි තීරුව අද පටන් දිග හැරෙන්නේ අපේ හිත ගත් කවියක විඳුම් විඳවුම් කෙබඳුද යන්න සහෘද ඔබත් සමඟ බෙදා හදා ගන්නටය. මෙය තවත් එක කාව්‍ය විචාරයක් නොවන අතර තොරාගනු ලබන කවියක් හොඳද නරකදැයි නිගමන නොදී, මිණුම් දඬු හා විචාරක්ෂීන් ගලවා තබා කවිය තුළම ගිලී කිමිදී රස උල්පත් පාදා ගන්නයි මේ කුඩා වෑයම.**

## අම්මාගේ නිළි මිතුරිය



රඟන ඒ නිළිය
දකින හැම විටෙකම
අපේ අම්මා කියයි

"පාසැල් කාලෙදි
අපි හොඳම මිතුරියෝ
හිටියෙ එකම පංතියේ
එක ලෑලි බංකුවේ
ඒ දවස් වල ඈ
ඔපමණම ලස්සන නෑ"

ඉන්පසුව අපෙ අම්මා
බලන්නේ තම අත් දෙස
කැඩුණු නියපොතු දෙස
මැල්ලුම් ලියද්දී
ලියෙන මහපටැඟිලි දෙස

අනතුරුව ඈ බලා අප දෙස
මගෙ මුහුණ, මල්ලිගෙ මුහුණ
ඇස් හීන් කර හිනා වෙනවා
ඇගේ මුහුණේ රැළි තුනී කර

*ඉසුරු චාමර සෝමවීර ( 'තාණ්ඩව' කාව්‍ය සංග්‍රහය - 2011 )*

තරුණ කවියකු වන ඉසුරු චාමර ගේ 'අම්මාගේ නිළි මිතුරිය' කවියයි අද තෝරාගත්තේ. මවක් වුණද කාන්තාවකට නිසර්ගයෙන් උරුම වී ඇති, කවදාවත් සංසිඳුවා ලිය නොහැකි, අවසර කල්හි නොදැනීම ඇවිලෙන, ඈටම ආවෙණික වූ ජීවන ලාලසාවන් ගැන හෙළු තියුණු නිරීක්ෂණයක් මේ කවිය තුළින් විද්‍යමාන වේ. කවිය පටන් ගන්නේ කිසියම් රංගනයක යෙදෙන සුරූපී නිළියක් අප ඉදිරියේ ප්‍රාදූර්භූත කිරීමෙනි. ඒ, නිවසේ රූපවාහිනී තිරය මතයි. මෙය සතිපතා මෙගා ටෙලියක් විය හැක. එය චක්‍රියව සිදුවන්නක් බව කවියේ මුල් කොටසින් පැහැදිලි වේ. ඇය දකින හැමදාම කථකයාගේ මවට කියන්නට කුමක් හෝ දෙයක් ඇත. අනවශ්‍ය විස්තර කථන වලින් මිදී පේළි තුනකින් පමණක් අපේ සංකල්ප ලෝකය පුළුල් කරන ඉසුරු, ඉන'නතුරුව කිසියම් කුහුලක අවක්ෂේප අපේ හිත මත තැන්පත් කරයි. එනම්, නිළියගේ රඟ සොබා හා රූපලාවන්‍යය දකින ඈ, තම දරුවන් අබියස කෙලෙස හැසිරුණිද යන්නයි.

දෙවැනි කොටසින්, උත්තම පුරුෂ ස්වරයෙන් ඔහු අම්මාව කැඳවයි. ඇගේම වචන හෙවත් ස්වාත්මාලාපය අමු අමුවෙන් අප හමුවේ ලිහෙන්නට ඉඩ හරී. ඈ කියන්නේ, තිරයේ රඟන නිළිය ඇගේ පාසල් සමයේ හොඳම මිතුරියක් බවයි. එහි කිසියම් ආඩම්බර ස්වරයක් තැන්පත් වී ඇත. ඔවැනි දේ කතා කිරීමට කාන්තාවන් කවදා අකමැති වේද? ඒ දේ මවක් වූ පමණින් අතුරුදන් වේද? ඒත් එක්කම එහි කිසියම් සානුකම්පිත ඉකිබිඳුම් ස්වරයක් ගැබ්වී ඇත. එනම් එකට සිටි, එක බත් පත බෙදන් කෑ හොඳම මිතුරියන් වුණත්, අද ඔවුන් දෙතැනක බවයි. සමහර විටෙක මිතුරිය රහසේම, මිණි පුළිඟු එළි දුලන ඇගේම වූ රිදී ලෝකයට ඉගිළී යන්න ඇත.

නමුත්, දෙවැනි කොටසේ අන්තිම පද පේළි වලින් පැවසෙනා පරිදි, නිළියක් වුවද ඈ ඉස්සර එතරම්ම ලස්සන නැත. කථකයාගේ අම්මා වඩා ලස්සනට ඉන්නට ඇත. මෙහිදී මිනිස් සිතේ අන්‍යයන් පරයා නැගෙන සියුම් ඉරිසියාවන් කෙළින්ම නොකියා ඉබේටම හැඟවෙන්නට අරින අයුරු අපූරුය. තවද තාක්ෂණිකව දියුණු අප සමාජයේ පාට පියරු තට්ටුවලට ඕනෑම ගොම රිටක් එක රාත්‍රියකින් සුපිරි තරුවක් කිරීම මහා දෙයක් නොවන බවත් ඒවායේ ඇතුළාන්තර කතා අපට වක්‍රව හැඟවෙන්න දෙන්නටත්, සංයමයෙන් ලියූ පද වැඩි ඉඩක් තනාදෙයි.

තම ආත්මකථනය කළ අම්මා එතකින් නොනවතී. අනතුරුව, නිළි මිතුරිය ගේ ලස්සනින් මානසිකව ඇද වැටෙන ඈ, දරුවන් තැනීමෙන්ම වෙහෙසුණු, උයා පිහා, ගේ දොර වැඩ කටයුතු කිරීමෙන්ම වියපත් වූ ඇගේ සකළ සරුවාංගය ගැනම පශ්චාත්තාප වේ. අතීතයේ ඈට හිමිව තිබුණු 'සැබෑ තුණු සපුව' ගැන කණගාටු වේ. මොනවා කරන්නද, අම්මලා නම් එසේම නොවේද? දරුවන් කැටුව නගින මහ ගිරි දඹ අත්හැර ඔවුන්ට හිතෙන හිතෙනා විටෙක රිදී තිර මත නතරවී, සිහින රාත්‍රීන් දිදුලවන සුපිරි තරු විය නොහැක. නමුදු, ඒ සාම්ප්‍රදායික 'අම්මා' නම් වූ අර්ථ දැක්වීමෙන් මිදී කාන්දුවන ඇගේ සැබෑ ගැහැනු ආත්මය අප හමුවේ දිගහරින්නට කොතරම්ම පොඩි වචන ගණනක්ද ඉසුරු යොදාගෙන තියෙන්නේ?

කවියේ අන්තිමම කොටසින් දරුවන් ගේ දෑස් තුළින් ඇය කියවගන්න සැබෑ ලෝකය හමුවේ, තිරය මත තම නිළි මිතුරිය දැකීමෙන් නැඟුණු අනවරත සිතුවිලි ජාලා බිඳීගොස්, උපේක්ෂාවෙන් පිරුණු ආසියාතික මවක් අප හමුවේ තබන්නට ඉසුරු සමත් වේ. මුහුණ මත ඇඳුණු දුක් සුසුම් රැළි තුනී වී ගොස්, දරුවන්ගේ සිනා මුව හමුවේ පුන් සඳ මඬලක් ව හිනැහෙන අම්මා කෙනෙක් අවසන ඉතිරි වේ.

යළිදු දිනයක, නිළි මිතුරියගේ රුවින් දකින පාට සිහිනයකින් පිටවාන බිඳී කඩා හැලෙන තුරු, එක්තරා කාන්තා ආත්මයක් ඒ ආසියාතික අම්මා ඇතුළත තාවකාලික නිද්‍රාවකට පත් වේ.